දුරකථන
தொலைபேசி
Telephone
2698471
2698475
2698490

ෆැක්ස්
பெக்ஸ்
Fax
2693866

විද්‍යුත් තැපැල
,மின்னஞ்சல்
e-mail
www.health.gov.lk
postmaster@health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය
எனது இல
My No.
NCD/41/2013

ඔබේ අංකය
உமது இல
Your No. :

දිනය
திகதி
Date
2013.11. 08

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක: 02-174/2013

සියලුම

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
විමධ්‍යගත අංශ ප්‍රධානීන්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,
අධ්‍යක්ෂ/ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
වෛද්‍ය අධිකාරීවරුන්/ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්/ ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්
ආයතන ප්‍රධානීන්,

**<u>බෝනොවන රෝග (NCD) කළමණාකරණය සඳහා අත්‍යවශ්‍ය ඖෂධ රෝගී සත්කාර ආයතන සතුව ඇති බව සහතික කිරීම සඳහා වන මාර්ගෝපදේශ</u>**

අත්‍යාවශ්‍ය ඖෂධ හිඟය, ශ්‍රී ලංකාවේ රෝගී සත්කාර ආයතනවලින් සේවය ලබා ගැනීමට අපේක්ෂා කරන්නන්ට ප්‍රශස්ත සේවයක් සැපයීමේ දී පවතින ප්‍රධාන බාධකයක් ලෙස හඳුනා ගෙන ඇත.

රෝගී සත්කාර ආයතන තුළ සුවදිවි සුරැකුම් මධ්‍යස්ථාන (Healthy Lifestyle Centres) පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ පිළිබඳ 2013.01.15 දිනැති අංක 01-25/2013 දරන චක්‍රලේඛයට අමතරව ඔබ පරිපාලන සීමාව තුළ වන සියලුම ආයතන සතුව අත්‍යාවශ්‍ය ලෙස හඳුනා ගෙන ඇති සියලුම ඖෂධ (ඇමුණුම 1) ග්ලූකෝ මීටර් (Glucometers), ග්ලූකෝ මීටර්ස් පටි (Glucometer strips), විදින කටු (Lancets), උස මනින උපකරණ (Stediometers), රුධිර පීඩනමාන උපකරණ (Blood pressure apparatus), බර මැණුම් උපකරණ (SICA) වාර්ෂික ඇස්තමේන්තු මත පදනම්ව වසර 2 ක් සඳහා ප්‍රමාණවත් පරිදි හදිසි අවස්ථා තොග පවතින බවට වග බලා ගන්නා මෙන්ද, අවශ්‍ය ද්‍රව්‍ය වාර්ෂික ඇස්තමේන්තුවලට ඇතුලත් කරන ලෙස අදාල සියලුම නිලධාරීන්ට උපදෙස් ලබා දෙන මෙන් ද,

රෝගී සත්කාර ආයතනවල සේවය ලබා ගැනීමට ඇපේක්ෂා කරන්නන්ට බෝනොවන රෝග සඳහා ප්‍රශස්ථ සේවයක් සැපයීම සහතික කරනු වස් ඉහත දක්වා ඇති ද්‍රව්‍ය ප්‍රයෝජනය සඳහා පවතින්නේද යන්න ක්‍රමවත් පදනමක් මත නියාමනය කිරීම හා ඇගයීම සඳහා අවශ්‍ය පියවර ගන්නා මෙන් ද කාරුණිකව ඉල්ලා සිටිමි.

වෛද්‍ය පී ජී මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.